# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2276/52 – 2022 අප්‍රේල් 22 වැනි සිකුරාදා – 2022.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 පෙබරවාරි මස 19 වැනි දින අංක 1798/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි පරිච්ඡේදය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 58 හා 2013. 02. 15 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2011/VE/144.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DER/LAN/LAQUI/A1/37.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටුළුගම් කෝරළේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ ලිඛියාගල (අ.ග.පි. 688) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KE/DRN/2011/219 හා 2012.11.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – අංහෙට්ටිගම වත්ත, මූණමලතුල්ලේහේන, මොරහේන, කැප්පෙටියතැන්නේහේන, කුඩුරලගේහේනේගාවහේන, මිනුවන්දෙනියේහේන – ප්‍රමාණය: හෙක්. 1.0313**

උතුරට: අ. ග. පි. 688 හි කැබලි අංක 122, 121, 120, 89 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B (මාර්ගය); නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B (මාර්ගය); දකුණට: අ. ග. පි. 688 හි කැබලි අංක 72 සහ 90; බටහිරට: අ. ග. පි. 688 හි කැබලි අංක 90, 122, 121, 120 සහ 89.

02. **කැබලි අක්ෂර ‘B’ – සඳහන් නොවේ – ප්‍රමාණය: හෙක්. 0.1498**

03. **කැබලි අක්ෂර ‘C’ – අංහෙට්ටිගම වත්ත, මූණමලතුල්ලේහේන, මොරහේන, කැප්පෙටියතැන්නේහේන, කුඩුරලගේහේනේගාවහේන, මිනුවන්දෙනියේහේන – ප්‍රමාණය: හෙක්. 0.8421**

උතුරට: අ. ග. පි. 688 හි කැබලි අංක 72; නැගෙනහිරට: අ. ග. පි. 688 හි කැබලි අංක 72; දකුණට: අ. ග. පි. 688 හි කැබලි අංක 72 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B (මාර්ගය); බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B (මාර්ගය) සහ අ. ග. පි. 688 හි කැබලි අංක 72.

EOG 04 - 0118


1A – G 36616 – 20 (2022/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*